## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
## ප්‍රසම්පාදන දැන්වීම

### ආපනශාලාව පවත්වාගෙන යාමට සේවා සපයන්නෙකු ප්‍රසම්පාදනය සඳහා ලංසු කැඳවීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ, සභාපති විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, ස්වයං සේවා බොජුන්හල (කැෆටේරියාව) සඳහා සේවා සපයන්නෙකු ප්‍රසම්පාදනය සඳහා එක් (01) වර්ෂයක කාල සීමාවක් සඳහා සුදුසු සේවා සැපයුම්කරුවන් වෙතින් **2024. 05. 10** වන දින ප.ව. 3.00 දක්වා, මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. සේවා සපයන්නා විසින්, උදෑසන ආහාරය සහ දිවා ආහාරය සැපයිය යුතුය. දිවා ආහාරය, බුෆේ (ස්වයංසේවා) ශෛලියට සහ/ හෝ කවුන්ටර (කවුළු) මාදිලියට අනුව සංග්‍රහ කළ යුතු ය.

ලංසු, එම ලංසු භාර ගන්නා අවසාන වේලාව ඉක්මවූ වහාම, 2024. 05. 10 වන දින, ප.ව. 3.00 ට, කොළඹ 07, වෝඩ් පෙදෙසේ, අංක 20 හි, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම් කාර්යාලයේ, නව මාණ්ඩලික රැස්වීම් කාමරයේදී (New Boardroom) හිදි, විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට සහභාගී වීමට ලංසුකරුවන්හට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයා හට අවසර දෙනු ලැබේ.

ලංසු ලිපිලේඛන, ආපසු ගෙවනු නොලබන රුපියල් පන්සීයක් (රු. 500/-) ගාස්තුවක් මුදලින්,විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සරප් වෙත ගෙවීමෙන් පසු නිකුත් කරන ලද මුදල් ලදුපත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, **2024. 04. 26** වන දින සිට **2024. 05. 10** වන දින දක්වා රාජකාරි දිනවලදී පෙ.ව.9.30 සිට ප.ව.3.00 අතරතුර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ජ්‍යේෂ්ඨ සහකාර ලේකම්/ සාමාන්‍ය පරිපාලන වෙතින්, ලබා ගැනීමට හැකිය.

ලංසු සුරක්ෂණ ඇපකරයක් ලෙස, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සරප් වෙත ආපසු ගෙවනු ලබන රුපියල් තුන්දහසක (රු. 3,000/-) ගාස්තුවක්, මුදලින් ගෙවිය යුතුය. ලංසු සුරක්ෂණ ඇපකරය ගෙවීමෙන් පසු ලබාගත් නිල මුදල් ලදුපත, සියලුම ලංසු සමඟ ඉදිරිපත් කළ යුතුය.

මුද්‍රා තබන ලද ලංසු ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ "ස්වයංසේවා බොජුන්හල සඳහා සේවා සපයන්නෙකු ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදනය" යනුවෙන් සටහන් කර, **2024. 05. 10** වන දින ප.ව.3.00 ට හෝ ඊට පෙර ලැබෙනසේ කොළඹ 07, වෝඩ් පෙදෙසේ, අංක 20 හි, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ, සභාපති වෙත, ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ කොළඹ 07, වෝඩ් පෙදෙසේ, අංක 20 හි, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, ජ්‍යේෂ්ඨ සහකාර ලේකම්/ සාමාන්‍ය පරිපාලන කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ යුතුය.

ලංසු පිළියෙල කිරිමේදී හෝ ඉදිරිපත් කිරිමේදී, ලංසුකරුවන්හට දරන්නට සිදුවන/ දරනු ලබන, කවර හෝ පිරිවැය හෝ වියපැහැදම් සම්බන්ධව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කිසිදු වගකීමක් නොදරනු ඇත.

වැඩිදුර තොරතුරු සඳහා දුරකථන අංක 011-2685183 මඟින් ජ්‍යේෂ්ඨ සහකාර ලේකම්/ සාමාන්‍ය පරිපාලන සම්බන්ධ කර ගත හැක.

සභාපති/ආයතනික ප්‍රසම්පාදන කමිටුව
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07.
2024. 04. 26